සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. පාසලක ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ ........................................................................................ ය.
(අංශ ප්‍රධාන ගුරුතුමා / නියෝජ්‍ය විදුහල්පති / විදුහල්පතිතුමා)

02. පාසලේ ඉතිහාසය දැන ගැනීම සඳහා .............................................................. වැදගත් මූලාශ්‍රයක් වේ.
(ලොග් පොත / පරිග්‍රහණ ලේඛනය / ලකුණු පොත)

03. ඔබ පාසලට ඇතුළත් වූ දිනය නිවැරැදිව බලාගත හැකි වන්නේ ....................................................... ලේඛනයෙනි.
(නාමලේඛනය / සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනය / පංති වාර්තා පොත)

04. අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඒ හා බැඳුණු ........................................................ඉටුකිරීම ශිෂ්‍යයකු විසින් විය යුතුය.
(සම්ප්‍රදායන් / චාරිත්‍ර / යුතුකම්)

05. ළමා මිතුරු පාසල් පරිසරයක ................................................................................ පන්ති කාමර පරිසරයක් ඇත.
(ප්‍රබෝධවත් / කලහකාරී / අක්‍රමවත්)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් ( ✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. පුද්ගලයා තුළ පවතින දක්ෂතා අවස්ථානුකූලව පෙන්වීමෙන් ආත්ම විශ්වාසය ගොඩනැගේ. (............)

07. යම් අයෙක් ඔබට ඔබගේ දුර්වලතා පෙන්වා දුන්විට ඒවා නිහතමානීව පිළිගත යුතුය. (............)

08. ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු වලින් සිසුන්ගේ සහජ කුසලතා පිරිහීමට ලක් වේ. (............)

09. පාසලේ නිල ඇඳුම පාසලේ අනන්‍යතාවය බාහිර ලෝකයාට ප්‍රකාශ වන එක් ආකාරයකි. (............)

10. තම සහෝදර සිසු සිසුවියන් අයහපත් ක්‍රියාවල නිරත කරවීම ශිෂ්‍යයකුගේ වගකීමක් වේ. (............)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වන්නේ,
    i. පාසලේ සියලු දෙනාගේ අයිතිවාසිකම් කඩ කිරීම සඳහා ය.
    ii. ළමයින් විනය විරෝධී පුද්ගලයින් බවට පත් කිරීමට ය.
    iii. පාසල ක්‍රමවත්ව පාලනය කිරීම සඳහා ය.
    iv. පාසල තුළ අයහපත් ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම සඳහා ය.



LIVEWORKSHEETS

12. පාසල් කොඩිය ඔසවන විට ප්‍රදර්ශනය කළ යුතු ඉරියව්වක් වන්නේ,
   i. පාසල් කොඩියට පිටුපා සිට ගැනීම.
   ii. පහසුවෙන් සිටීම.
   iii. පාසල් ගීය හිමින් මිමිනීම.
   iv. පාසල් කොඩිය අභිමානවත්ව එසවීම.

13. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් එක් වීමෙන් සෑදෙන පරිපාලන ඒකකයේ ප්‍රධානියා වන්නේ,
   i. ග්‍රාම නිලධාරී
   ii. ප්‍රාදේශීය ලේකම්
   iii. දිස්ත්‍රික් ලේකම්
   iv. අමාත්‍යාංශය ලේකම්

14. භෞතික සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ මින් කුමක්ද?
   i. පාංශු රක්ෂණය
   ii. රුක් රෝපණය
   iii. පොලිතින් පරිසරයට මුදාහැරීම.
   iv. විකල්ප ද්‍රව්‍ය භාවිතය

15. උප්පැන්න සහතික නිකුත් කිරීමේ ආයතනය වන්නේ,
   i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
   ii. ප්‍රාදේශීය සභාව
   iii. මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
   iv. පළාත් අධ්‍යාපන කාර්යාලය

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**



**A**

16. **A** පින්තූරයෙන් දැක්වෙන්නේ ........................................................................ මහතාය.

17. එතුමා ........................................................................ පියා යන අන්වර්ථ නාමයෙන් හැඳින්වේ.

18. එතුමා ........................................................................ ලංකාවේ ආරම්භ කරමින් අධ්‍යාපනයට විශාල මෙහෙවරක් කළේය.



**B**

19. **B** රූපයෙන් දැක්වෙන අවස්ථාවකට ඔබ සම්බන්ධ වූ විට ඔබට ලැබෙන අත්දැකීම් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................

   ..............................................................................................................................

2. ..............................................................................................................................

   ..............................................................................................................................

20. **B** පින්තූරයෙන් දැක්වෙන අවස්ථාවකදී ඇතිවිය හැකි අනතුරු දෙකක් ලියන්න.

   1. ..............................................................................................................................

   2. ..............................................................................................................................

(20 × 2 = ලකුණු 40)



LIVEWORKSHEETS